# 'පට්ඨාන' දහනම වැනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝක ධාතුවටම ධර්ම ආලෝකය විහිදුවමින් පතුරුවමින් සත්වයා කෙරෙහි මහත් කරුණාවක් දයාවක් පතුරුවමින් ලෝකයට පහළ වී වදාළාවූ සියලුම ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම පැහැදිලිව පිරිසිඳුව අවබෝධ කොට ගත්තාවූ පාරමී ධර්මයන්ගෙන් උත්තරී භාවයට පත්උනාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාවෙන් පිරුණු නුවණැසින් පිරුණු සන්තානයට පෙනීගියාවූ දැනී ගියාවූ අවබෝධ උනාවූ උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට කරුණාවෙන් දේශනා කොට වදාළා වූ ප්‍රතිපත්ති මූලික වූ ඒ උතුම් ධර්මයට ධර්ම රත්නයට මම නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන් කොට නිර්වාණ ධාතුව අවබෝධ කරගනිමින් නිවනින් සැනසී ආර්ය පුද්ගල භාවයට පත්වී බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවක භාවයේ පිහිටියාවූ අෂ්ඨාර්යපුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ අනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ අනන්ත අපරිමාණ ගුණ ආනුභාව බලයෙන් ඒ අනන්ත ගුණ ඇති බුද්ධ ධර්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීම තුලින් පහළ උනාවූ වන්දනාමය කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් සියලු දෙනාම මේ මොහොත දක්වා සිදුකර ගත්තාවූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ වැඩ සටහන ඉතාමත්ම හොඳින් සිද්ධ කරගෙන යන්න මානසික පරිසරය ඇතිවේවා! කිසිම බාධක ධර්මයක් ඉදිරිපත් නොවේවා! ක්ලේශ ධර්මයන්ගෙන් හිත්වලට පීඩාවක් නොම වේවා! චිත්ත සමාධි ගති ඇතිවේවා! සිහිය පිහිටාවා! ප්‍රඥාව අවධි වේවා! ථීනමිද්ධ ගතියක් කල කම්මැලි ගතියක් ඇති නොවේවා! ඉන්ද්‍රිය ධර්මයන් බල ධර්මයන් බවට පත්කර ගනිමින් බොජ්ඣංග ධර්මයන් බවට පත්කර ගනිමින් පිරිසිඳු කුසල සිතක් ඇතිව මේ උතුම් ධර්මය වටහා ගන්ට අවබෝධ කරගන්ට හැකිවේවා! මේ ධර්ම මනසිකාරයම හැම දෙනාටම පරම ශාන්ත වූ අභියාදර ධර්මයක් වූ උතුම් නිර්වාණ ධාතුව අවබෝධ කරගන්නටත් හේතුවේවා! වාසනාවේවා! කියල මෛත්‍රීයෙන් පළමු කොටම ප්‍රාර්ථනා කරනවා.

අපි සියලු දෙනාම මේ ගත කරන්නේ වෙසක් සමය. වෙසක් පුර පසළොස්වක පොහොය ඇවිල්ල සතියක් හමාරක් ගත උනත් තවම ඒ සුවඳ ඒ දහම් සුවඳ ඒ ධර්ම මනසිකාර හිතේ රැව් පිළිරැව් දෙනවා. ලෝක වාසී විසාල බෞද්ධ පිරිසක් බුදුරජාණන්වහන්සේගේ ඒ කරුණා සිතෙන් දේශනා කළාවූ ඒ දේශිත ධර්මයන් මෙනෙහි කරනවා ගැඹුරු ධර්මයන් හොයනවා

මෙනෙහි කරනවා. ඒවාගේම බණ භාවනා වලට හිත් පෙළ ගස්සා ගන්නවා. සමාධි ගුණ වඩා ගන්නවා. සිහිය පවත්වා ගන්නවා. මේ ආකාරයේ දාන සීල භාවනා ආදී පින්කම් සිද්ධ කරගන්නවා. ඒ තුලින් ඒ මාර්ගයෙන් ඒ ප්‍රතිපත්ති ක්‍රමයෙන් මොහොතින් මොහොත සසර දුකෙන් මිදිලා වට්ට දුක්ඛයෙන් මිදිලා නිර්වාණ ධාතුවට ලංවෙන බව අපිට අහන්ට දකින්න ලැබෙනවා. ඒ අතර සුපුරුදු විදියට බොහොම කාලයක් ධර්‍ම මනසිකාරය පවත්වාගෙන එන මේ පින්වත් සැම දෙනාම අද මේ අභිධර්ම පාඩමට යොමුවෙලා හිත් යොමු කරගෙන සූදානම් වෙලා සිටිනවා තවත් අලුත් ධර්‍මයක් ධර්‍ම කාණ්ඩයක් හිතන්ට මෙනෙහි කරන්ට අසන්ට.

මේ ධර්‍මය විස්තර කරන්නාවූ පෙර ආචාර්යවරයන් වහන්සේ නමක් එක තැනක සඳහන් කරනවා තමන් වහන්සේ විසින් මේ කියල දෙන්නාවූ උදාහරණ උපමා දක්වමින් විස්තර කරමින් අඩුවක් නැතුව පැහැදිලි කරල දෙන්නාවූ මේ ධර්‍මය - **'ඉතිමෙ භාසමානස්ස, අභිධම්මකථං ඉමං'** – ' මේ විදියට මම කියල දෙන්නාවූ මේ අභිධර්ම කථාව - මේ අභිධර්ම විස්තරය - **'අවික්ඛිත්තා නිසාමෙථ, දුල්ලභාහිඅයංකථා'** – 'මේ අභිධර්ම කථාව අභිධර්ම සාකච්ඡාව අභිධර්ම විස්තරය හරීම දුර්ලභයි. ඒක නිසා හිත් වික්ෂිප්ත කරගන්නේ නැතුව **'අවික්ඛිත්තා නිසාමෙථ'** –'හොඳින් අහන්ට - සමාධි ගත සිතෙන් අහන්ට' කියල උන්වහන්සේ මතක් කරනවා ඒ ගාථාවෙන්. ඒවගේ අදත් මේ පින්වතුන්ට මේ කියල දෙන ධර්‍ම කොට්ඨාසය මේ වෙසක් සමයේ මේ ඉදිරිපත් කරගන්නාවූ ධර්‍ම කාණ්ඩය හොඳින් පැහැදිලිව තේරුම් ගන්ට හැකිවේවා! ඉතින් අද මේ වෙලාවේදී අපි එක ධර්‍ම කණ්ඩයක් මතුකරලා ගන්නවා.

පසු ගිය සතියක අපි ඉදිරිපත් කරගත්ත එක ධර්‍ම කොටසක් - ප්‍රත්‍යය ධර්‍මයක් - ඒ තමයි උපනිශ්‍රය ප්‍රත්‍යය ධර්‍මය. 'උපනිශ්‍රය ප්‍රත්‍යය' - විශේෂ හේතුවක් වෙන විශේෂ ධර්‍මයක් වෙන එහෙම නැත්නම් තමන් පළමුවෙන් පහළ වෙලා පසුව දිගට උපකාර වෙන්නාවූ එක්තරා විදියක ප්‍රධාන කාරණයක් වෙන ධර්‍මයක් උපනිශ්‍රය ධර්‍මය. ඒ ගැන අපි මුල් කරුණු තුනක් කිව්වා. ඒ කියපු එක තමයි ආරම්මණ ස්වභාවයෙන් උපනිශ්‍රය වීම - ඊළඟට අනන්තර ස්වභාවයෙන් උපනිශ්‍රය වීම - ප්‍රකෘති වශයෙන් උපනිශ්‍රය වීම. මේ උපනිශ්‍රය ප්‍රත්‍යය කියන එක ඔය විදියට තුන් ආකාරයකට විස්තර වෙන බව අපි මේ පින්වතුන්ට මතක් කරා. අපේ මේ දහම් වැඩ සටහනේදී සිහිය නුවණ යොදාගෙන අපි නැවත ආපසු ගිහිල්ල අපි මේ කථා කරන්නාවූ දේවල් මොනවාදැයි නැවත හිතේ මුදුනට ඉහළට හාරා අවුස්සාගෙන මේ වැඩේට බැස්සහම කරගෙන යන කථාවෙන් ඉදිරිපත්වෙන ධර්‍ම තේරුම් ගැනීමට යම් පහසුවක් උපකාරයක් සිද්ධ වෙනවා. ඒනිසා අපි හිතමු මොනවාද මේ ප්‍රත්‍යය ධර්‍ම ස්වභාවයන් පිළිබඳව කථා කරන්නේ කියල. ප්‍රත්‍යය ධර්‍ම ස්වභාව 24 ක් විස්තර කරලා තිබෙනවා. ඒකට කියනවා අපි සූවිසි පට්ඨානය ධර්‍මය කියල. ඒ සූවිසි පට්ඨාන ධර්‍ම එකක් එකක් වශයෙන් අරගෙන ගැඹුරු ගැඹුරු විදියට අතුදදා - අතු පතර යමින් - එක එකට සම්බන්ධ වේවී - එකින් එකට සම්බන්ධ වෙවී - විහිදිලා පැතිරිලා ගැටගැහිලා තිබෙන්නාවූ මේ එක එක උපකාරක ධර්‍මයන්ගේ ස්වභාව ගොඩවල් 24 කට දාල - පැහැදිලිව තේරුම් ගන්ට විස්තර කරලා

දේශනා කරලා තිබෙනවා. අපි මේ දක්වා ඒ 24 රෙන් හේතු ප්‍රත්‍යය ගැන කථා කළා - ආරම්මණ ප්‍රත්‍යය - අධිපති ප්‍රත්‍යය - අනන්තර ප්‍රත්‍යය - සමනන්තර ප්‍රත්‍යය - සහජාත ප්‍රත්‍යය - අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය - නිස්සය ප්‍රත්‍යය - උපනිශ්‍රය ප්‍රත්‍යය ගැන කථා කළා. දැන් අද අපි මේ උපනිශ්‍රය ප්‍රත්‍යය ගැන කථාකරන තැනක තමයි ඉන්නේ. උපනිශ්‍රය ප්‍රත්‍යයයේ ආකාර තුනක් කිව්වනේ. දැන් අපි කථා කරමු ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය. විශේෂ හේතුවක් වෙන නිසා අපි තේරුම් ගන්ට ඕනෑ, මේ පකති උපනිශ්‍රය ගැන කියන කොට අපි කිව්වා කලින් කලින් පහළ වෙච්ච කුසල ධර්මයෝ පසු පසුව ඇතිවෙන්නාවූ කුසලයන්ට උපනිශ්‍රය වෙන විදිය. ඊළඟට අකුසල ධර්මයෝ අකුසල ධර්මයන්ට උපනිශ්‍රය වෙන විදිය. හැබැයි අපි නොකියා නවත්තපු කාරණයක් තිබෙනවා අව්‍යාකෘතය කියන එක. අව්‍යාකෘතය කොහොමද උපනිශ්‍රය වෙන්නේ කියල අපි තේරුම් ගත යුතුයි. දැන ගත යුතුයි. හැබැයි ඊට කලියෙන් තව එකක් දැන ගන්ට ඕනෑ.

සූත්‍ර අනුසාරයෙන් කුසල් පිළිබඳව කථා කළා - බණ ඇහුවා - අපි බණ කිව්වා -සාකච්ඡා කළා - ඒවගේම කුසල් අකුසල් වශයෙන් අපි බණ අහල තියෙනවා. ඒක නිසා කුසලය අකුසලය තේරුම් ගන්ට මහ ගැඹුරෙන්ම බැරි උනත් කථා ව්‍යවහාරයෙන් ආශ්‍රයෙන් තේරුම් ගන්ට පුළුවන්. අව්‍යාකෘතය එහෙම නෙමෙයි. ටිකක් ඒක වචනය කන වැටෙන කොටත් යම්කිසි හැප්පිල්ලක් අමුතු ගතියක් නුහුරු නුපුරුදු ගතියක් ඕකේ දැවටෙනවා. ඒක නිසා අපි මේ අව්‍යාකෘත කියන පදේ නැවත වතාවක් තේරුම් අරගෙන ඉස්සරහට යං.

දැන් මේ කථාවේ මාතෘකාව ඇවිල්ලා ප්‍රකෘති උපනිශ්‍රය. ප්‍රකෘති උපනිශ්‍රය කථා කරන්න වෙන්නේ අව්‍යාකෘතය සම්බන්ධයෙන්. මේ පින්වතුන්ට මතක ඇති මේ වැඩ සටහන පටන් ගන්න කලියෙන් අපි යම්කිසි තැනකදී තික මාතිකාව කිව්වා. ඒ තික මාතිකාවේ ආරම්භක අවස්ථාවේදී තියෙනවා සියලුම ධර්මයන් තුන් ගොඩකට බෙදනවා. මතක ඇතිනේ? ධර්මයෝ කියල කිව්වේ සිත් 89 ත් චෛතසික 52 ත් රූප 28 ත් නිර්වාණ ධාතුවත් කියන මේ වෙන වෙන හැඩ රුව තිබෙන - ලක්ෂණ ගුණ තිබෙන්නාවූ - ගුණ දරන්නාවූ මේ ධර්ම 170 අපි කාණ්ඩ කරගෙන තිබුන - කුසල ධර්ම - අකුසල ධර්ම - අව්‍යාකෘත ධර්ම හැටියට. ඔහොමනේ අපි පටන් ගත්තේ. මේවා බෙදනවා ගොඩවල් තුනකට. මේ 170 සමහර ඒවා කුසල් ඒක නිසා කුසලා ධම්මා කිව්වා. මේ ධර්ම 170 තුල සමහර ධර්මයෝ අකුසල් - අකුසලා ධම්මා කියල කිව්වා. මේ ධර්ම 170 වේ සමහර ධර්මයෝ අව්‍යාකෘතයි - අබ්‍යාකතා ධම්මා කියල කිව්වා.

- කුසලා ධම්මා
- අකුසලා ධම්මා
- අබ්‍යාකතා ධම්මා.

මේ මාතිකාව ඉස්සරවෙලාම මේ හිත් වලට දැම්මේ නිකං නෙවෙයි. මේකේ තියෙනවා යම්කිසි උපකාරක ගතියක්. මේ ටික දන්නේ නැතුව මේක අතගහන්න බැහැ. පට්ඨානයට

එන්න බැහැ. ඒනිසා මේකේ කිව්වා නේද වචනයක් කුසලා ධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා කියල.

කුසල ධර්මයෝ දන්නවා. අකුසල ධර්මයෝ හිතා ගන්න පුලුවන්. අබ්‍යාකතා ධම්මා කියන්නේ මොකක්ද? අව්‍යාකෘතය කියල කියන්නේ මෙන්න මේ ටිකටයි. කුසලත් නොවන අකුසලයකුත් නොවන ගති තිබෙන ධර්ම තිබෙනවා. බලන්න, මේක තේරුම් ගන්න. කටු ගහක් ගත්තහම කටු ගහේ තිබෙනවා - ඒ කටු ගහ පැලවෙලා - අතු බෙදිලා - කටු හැදිලා - රිකිලි දාල - වැල් වශයෙන් ගිහිල්ල -කොළ හැදිලා - මල් හැදිලා - ඒ කටුගහේ ලඟ ඉන්න අය පටලොව ගන්න ගතියක් තියෙනවා. ඒවගේම තමයි පැටලී පැටලී ඉස්සරහට යන ගතියක් තියෙනවා ඒවගේම කටු මල් - කටු ගෙඩි හදල නැවත කටු හදන්න පුළුවන් ගතියක් තියෙනවා කටු ගහේ - ඒක හරියට අකුසල් වගේ. දැන් බලන්න රෝපණය උනහම ඒක වැඩිලා අනාගතයේදී මොකක් හරි දෙයක් ඒකෙන් බද්ධ වෙන්න පුළුවන් ගතිය තියෙනවා. ඒක නිසා මේ අකුසලය කියන එකේ තියෙනවා ඉස්සරහට නිෂ්පාදනය වෙන ස්වභාවයක්. හැබැයි අව්‍යාකෘතයේ ඕක නෑ. ඉස්සරහට ගෙනියන්න පුළුවන් ගතියක් නෑ ඔහේ මැටි ගුලිය තිබ්බ වගේ තියෙනවා. තව එකක් තියෙනවා - කුසලා ධම්මා - කුසලා ධම්මා කියල කිව්වහම සමන් පිච්ච වැලක අත්තක් අරගෙන කොතන හරි බිමක දාල රෝපණය කරහම සමන් පිච්ච වැල වැඩිලා ගිහිල්ල - ඒකෙ තියෙනවා වැඩෙන ගතියක් - සුවඳ හම හමා වැඩෙන ගතියක් තිබෙනවා. ඒවගේම ඒකෙ අත්තක් තව තැනක කපල පැලකරායින් පස්සේ ඒක කොහේ හරි ගිහිල්ල බිම තැවුරුනොත් මුල් අල්ලලා ඉස්සරහට යන ගතියක් තියෙනවා. ඒනිසා පැලවීමේ - තවත් ගහක් හැදීමේ - පැලකිරීමෙන් - වැඩි කිරීමෙන් - ඒවගේම සුවඳ විහිදුවමින් මල් ඇති කරන ගතියක් තියෙනවා.

හැබැයි අව්‍යාකෘතයට ඕක නෑ. කුසලයේ තියෙනවා විපාක උපදවන ගතිය - අකුසලයේ තියෙනවා විපාක උපදවන ගතිය. අව්‍යාකෘතය කියල කියන්නේආන්න එහෙම ඉස්සරහට ගෙනියල එයාගේ ශක්තියකින් විපාකයක් result එකක් තව අමුතු එකක් ඇතිකිරීමට හැකියාව ගුණය බලය නෑ ඒකෙ. අන්න ඒ නිසා කුසලත් නොවන - අකුසලත් නොවන දේවල් වලට කියනවා අව්‍යාකෘතයි කියල. මේ අව්‍යාකෘත මණ්ඩියේ - මේ අව්‍යාකෘත ගොඩේ තිබෙනවා අව්‍යාකෘත ධර්ම කාණ්ඩ තිබෙනවා 5 හක් විතර. අව්‍යාකෘත කියන වචනය යටතේ අව්‍යාකෘත ධර්ම හැටියට තිබෙනවා ගොඩවල් 5 ක්විතර. ඒවා තියෙනවා මෙහෙම - ප්‍රධාන වශයෙන් තියෙන්න හතරයි - බෙදීමක් තියෙනවා. දැන් විපාක තියෙනවනේ - විපාක සිත් වශයෙන් තියෙනවා 36 ක්. දැන් විපාක සිත් 36 විපාකය පහළ වෙන්නේ ඒ විපාකය ඇතිවෙන්ට කලියෙන් හැදිච්ච මොකක් හරි බලයකින්. ඒක කුසල බලයක් වෙන්න පුළුවන් අකුසල බලයක් වෙන්න පුළුවන් - ඒකෙ විපාක. හැබැයි විපාකයට නෑ ඉස්සරහට යන්න පුළුවන් ගතියක්. ඒ විපාකයේ බලයක් ඒ විපාකයේ ශක්තියක් නිසා ඉස්සරහට තව එකක් ඇති කරන්ට බෑ. ඒක නිසා විපාක සිත් 36 යම මොනවාද? අව්‍යාකෘතයි. විපාක සිත් කියන ඒවා අව්‍යාකෘතයි.

ඊළඟට කියනවා ක්‍රියා සිත් කියල. ක්‍රියා සිත් තියෙනවා 20 ක් විතර. ඒ ක්‍රියා සිත් 20 ඇවිල්ල ක්‍රියා මාත්‍රා පමණයි. ඒ ක්‍රියා සිත් වලට ආයෙත් අර කුසල් වලට වගේ අකුසල් වලට වගේ ඉස්සරහදි තව එකක් එයි කියල - ඒ ක්‍රියාවේ ශක්තිය ඇතිකරන්ටෙයි - හදන්ටෙයි - නිර්මාණය කරන්ටෙයි - ඒවා නෑ. ඒවා ක්‍රියා මාත්‍රා විතරයි. ඒක නිසා ක්‍රියා සිත් කියන ඒවත් අව්‍යාකෘතයි. දැන් බලන්ට තේරෙනවා - විපාක සිත් අව්‍යාකෘතයි - ක්‍රියා සිත් 20 අව්‍යාකෘතයි. අනිත් එක ඔය විපාක සිත් අස්සේ ක්‍රියාත්මක වෙන චෛතසික ඔක්කොම ගත්තට පස්සේ 38 ක් තියෙනවා. ඒ විපාක සිත් ඇතුලට ඒවාට සම්බන්ධ වූ - ක්‍රියා සිත් ඇතුලට ඒවාට සම්බන්ධ වූ චෛතසික ධර්ම 38 ම අව්‍යාකෘතයි. ඇයි එහෙම කියන්නේ චෛතසික ධර්ම 38 අව්‍යාකෘතයි කියල? හේතුව මේ චෛතසික 38 වැඩ කරන්නේ ක්‍රියා සිත් අස්සේ. ක්‍රියා සිත අව්‍යාකෘත නම් චෛතසික වෙන එකක් වෙන්න බෑ. ඒවත් අව්‍යාකෘතමයි. විපාක සිත් අව්‍යාකෘතයි නම් ඒකත් එක්ක වැඩ කරන චෛතසිකත් අව්‍යාකෘතයි. දෙමව්පියෝ යම් ආකාරයකට නමක් තියාගෙන ඉන්නවද දරුවොත් ඒ නමම තමයි. දරුවන්ට වෙන විදියක් වෙන්ට බෑ. ඒ ගති ගුණ - ඒ කෑම බීම - ඒ පළාත - ඒ ඇඳුම් - ඒ රටාව - ඒ ශක්තිය පිහිටනවා. ඒ වගේම යම් කිසි ගහක කොළ හැදුනොත් එහෙම ගහේ හැටියටම තමයි. ඒ ගහේ කොටසක් හැටියට - ඒක නිසා යම් කිසි ගහකට - කොස් ගහට කොස් ලීය කියනවා නම් - කොස් ගහ කියනවානම් - කොස් මුල කියනවානම් - කොළෙත් කොස් කොළේ තමයි. දෙල් හග කියනවා නම් - දෙල් මුල කියනවානම් - දෙල් අත්ත කියනවානම් - කොළෙත් දෙල් කොළේ තමයි. ඒවගේ සිතක් විපාක සිතක් නම් ඒක අව්‍යාකෘතයි නම් ඒ චෛතසික ටිකත් අව්‍යාකෘතයි. ක්‍රියා සිත් වල චෛතසිකත් අව්‍යාකෘතයි. අනිත් එක තමයි රූප ධර්ම 28 කිසිම දෙයක් අනාගතේට නිෂ්පාදනය කරන්ට බෑ. හැබැයි රූප හැදෙනවා විපාකයක් හැටියට. යම් කිසි කුසල චිතක විපාකයක් හැටියට හැදෙනවා හැබැයි රූප ධර්ම වලට ඉස්සරහට ගෙනියන්න හැකියාවක් නෑ. ඒක නිසා රූප ධර්මයෝ සියල්ලක්ම අව්‍යාකෘතයි. අනිත් එක නිර්වාණ ධාතුව. නිර්වාණ ධාතුවත් අව්‍යාකෘතයි. දැන් මෙන්න මේ කාණ්ඩය හොඳට අපි තේරුම් ගන්ට ඕනෑ. මෙච්චට කියනවා මොකක්ද? අව්‍යාකෘත කියල පොදු නමක්. කුසල අකුසල අව්‍යාකෘත කියල ඒ මාතෘකා තුන යටතේ කථාකරන කොට මේ කියාපු ධර්ම කාණ්ඩයට කියනවා අව්‍යකෘතයි කියල. අව්‍යාකෘත ධර්ම වලට මේ ටිකම අයිතියි. ගණන් තියාගන්ට මෙච්චරක් තියෙනවා කියල.

- විපාක සිත් 36
- ක්‍රියා සිත් 20
- චෛතසික ධර්ම 38
- රූප ධර්ම 28
- නිර්වාණ ධාතුවයි

මේ සියල්ල අව්‍යාකෘතයි. අනාගතයට පරම්පරා ගෙනියන්ට - අනාගතයට විහිදුවන්ට හැකියාවක් මේවගේ නැති නිසා. දැන් ඔය ටික ඔය විදියට තේරුම් අරගෙන - දැන් මම මෙච්චර කියල දුන්නෙ අව්‍යාකෘත කියන වචනයයි -අව්‍යාකෘත කියන ධර්ම කාණ්ඩයයි - ඒකෙන් කියල දෙන ධර්ම කාණ්ඩය - 'අව්‍යාකෘත ධර්ම'.

ඔය ටික ඔහොම තේරුම් අරගෙන ඕකත් ඔහොම හිතේ තියාගෙන අපි හැරෙමු උපනිශ්‍රය ප්‍රත්‍යය ගැන පොඩ්ඩක් කථා කරන්න. උපනිශ්‍රය ප්‍රත්‍යයයේ කුසල ගැන කථා කළා. අකුසල ගැන කථා කළා අද මෙන්න මේ වචනයෙන් කථා කරමු. මොකක්ද? අව්‍යාකෘත ධර්මය හේත්තු කරලා මුල් කරලා ප්‍රකාශ කරන ප්‍රධාන වාක්‍ය දෙකක් තියෙනවා - දේශනා පද දෙකක් තියෙනවා.

**'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො'** - ඔන්න අව්‍යාකෘත ධර්මයේ උපනිශ්‍රය ගුණයක් මේකෙන් කියනවා.

බලන්න **'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා'** කියල කියන කොට කලින් කලින් පහළ වූ පළමුව පළමුව පහළ වූ අව්‍යාකෘත ධර්ම ටිකක් තියෙනවා. ඒ ධර්ම වල තිබෙනවා උපනිශ්‍රය ගුණ ස්වභාවයක්. ප්‍රධාන වශයෙන් උපනිශ්‍රය වෙන තත්වයෙන් හැබැයි මේ අව්‍යාකෘතය කියන එකේ කුසල ගතිය නෑ අකුසල ගතිය නෑ නමුත් එකේ තිබෙනවා ප්‍රධාන උපකාරක ධර්මයක් වීමේ ගතිය. ඒකනේ උපනිශ්‍රය කියන්නේ. අව්‍යාකෘත ධර්මය මොකටද උපනිශ්‍රය වෙන්නේ? පසුව පසුව පහළ වෙන්නාවූ කුසල ධර්මයන්ට - **'පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො' -** ඔන්න ඔය විදියට තමයි තියෙන්නේ. අපි බලමු ඕක තියෙන්නේ කොහොමද කියල - පළමු පළමු පහළ වෙන අව්‍යාකෘත ධර්ම.

දැන් අපි බලමු මේක වෙන්නේ කොහොමද කියල. අපිට ඔය ගමන් බිමන් යනකොට හොඳ තේ බොන්න හම්බවෙනවා. ඒවගේම හොඳ කෑම කන්න හම්බවෙනවා. හොඳ උණුසුමක්හම්බ වෙනවා. හොඳ වාහන වල යන්න හම්බවෙනවා. හොඳ පුටුවක වාඩි වෙන්න හම්බවෙනවා. හොඳ ගෙදරක ඉන්ට හම්බවෙනවා. හොඳ නගරයක අසිරිය විඳින්ට ලැබෙනවා. හොඳ පළාතකට යන්න හම්බවෙනවා. ඉතින් ඔහොම යනකොට අපිට දැනෙනවා සැපයක්. අපි හිතමුකො හොඳ වාහනයක යනකොට ඒ වාහනේ හොඳට comforatble. සැප පහසුයි. ඒවගේම පේනවා ඒක ලේසියෙන් හසුරුවනවා. එතකොට ඒ විදියට ඒක හම්බවෙන්නේ ඇයි? අපිට එහෙම හම්බ වෙනවා. වාහනේ අනුන්ගේ වෙන්න පුළුවන් අනිත් රටක වෙන්න පුළුවන් ඒ අපිට දැනෙන සැප ඔය. මොකක්ද ඒ දැනෙන සැප? ඒක ඇවිල්ල විපාකයක්. ඒ අපිට දැනෙන්නේ විපාකයක්. ඒක අපිට දකින්න හම්බඋනේ - විඳින්නට හම්බඋනේ - ඒවගේ තැනක ඉන්න හම්බ උනේ - ඒක අපිට ලැබිච්ච යම් කිසි විපාකයක්. අපි හිතමු හුළඟක් ඇවිල්ල අපේ ඇඟේ වැදීගෙන යනවා හරී පහසුවෙන්. හුළඟ ඇවිල්ල හමන්නේ අපේ කරුමයට නෙමෙයි. ඒක අපේ කර්මයෙන් හඹාගෙන එන සුළඟක් නෙමෙයි. ඒක ස්වභාවයක් නමුත් අපේ ඇඟේ වැදිලා ස්පර්ශවෙලා අපිට පහළ වෙනවනේ අර කායික සැප ගතියක් - හරිම සිසිල් හරිම වින්දනීය ගතියක් ඇති වෙනවනේ කායික

පහසුවක් - ඕක ඇවිල්ල කාය විඤ්ඤාණයනේ - සැපය. හැබැයි ඒක ලැබෙන්නේ අපි කොහේ හෝ වේවා මීට ඉස්සරවෙලා මේ ජීවිතේ හෝ වේවා පෙර ජීවිතේ හෝ වේවා කොහේ හෝ වේවා සිද්ධ කරපු කුසලයක විපාකයක් හැටියට තමයි මේ වෙලාවේ අර පහසුවක් අපිට ලබාදීලා ලංකරලා තිබෙන්නේ. ඒ කායික සැපය හේතුකරගෙන අපිට ඇතිවෙනවා පස්සේ - ඕක හොඳට දැනෙනවා ඇඟට. ඒක එහෙම දැනුනට පස්සේ ඒ වින්දනය හිතේ store වෙනවා. ඕක හොඳට install වෙලා - හොඳට පදන් වෙලා - හොඳට ටිකක් හිතට දැනිලා - හොඳට හිතට අහුවෙලා - ඕක පිළිබඳව වැඩි පුර හිතල 'අනේ කොච්චර වටිනවද' කියල ඒ සැපය අගේ කරලා දැන් මොකද කරන්නේ? ඒක දැන් අත්විඳලා තියෙන්නේ. මොකක්ද අත්වින්දේ? ඉස්සරවෙලා කරපු කුසලයක විපාකයක් ඔන්න වින්ද. ඒ විපාකය කියල කියන්නේ මොකක්ද? අව්‍යාකෘතයක්. අපි කිව්වනේ ඔක්කොම විපාක සිත් අව්‍යාකෘතයි කියල. ඒක අව්‍යාකෘතයක්. ඒ අව්‍යාකෘතය කැවෙනවා - දැන් අපිට තේරෙන්නෙ නැනේ පෙර පින් කරලා තියෙනවාය - අපි මෙහෙ අහවල් දවසේ මෙහෙම කරලා තියෙනවාය කියල -ඔහොම මතකයක් නැනේ. අපි ධර්ම න්‍යායේ පිහිටලා හෝ පෙර ජීවිත පිළිබඳව මෙනෙහි කරන්ට - පෙර ආත්ම සිහි කරන්ට පුළුවන් කර්මය කර්ම විපාකය තේරුම් ගන්ට පුළුවන් නුවණක් තියෙන කෙනෙකුට ඇරෙන්ට අනිත් අය ධර්ම න්‍යායෙන්නේ ඕක තේරුම් ගන්නේ. ඉතින් අපිට ඇත පෙනෙන බුදුරජාණන්වහන්සේගේ කර්ම විපාක ඥානයක් වගේ ඥානයක් නැනේ. පෙර ජීවිතියේ මේ විදියට කරා - ඊළඟ ජීවිතියේ කල්ප මෙච්චර ගානකින් මෙහෙම කරා කියල ඒ කරපු කුසලය තේරුම් ගන්ට හැකියාව නෑ. නමුත් ඒ කරපු දෙයින් විපාකය විඳින එකනම් හොඳට කාවැදිලා යනවා අපේ හිතේ. දැන් ඔන්න ඔය විඳපු ඒ කායික සැපය විපාකයක් හැටියට - විපාක අව්‍යාකෘතය - ඕක කැවෙනවා හිතේ. ඔය ගැන නැවත නැවත ඊට පස්සේ ටිකක් වැඩියෙන් හිතල හරියට ඒ සැපය ගරු කරනවා. හොඳට ගරු කරනවා. වැඩියෙන් හිතනවා. වැඩියෙන් වැඩිය හිතල ඒක හිතේ පැළපදියන් වෙලා දැන් පස්සේ ඕනෑ වෙනවා ඒ සැපය - වාහනයක යන සැපය - වාඩි වෙලා ඉන්න සැපය ඒවාගේම ඒ පළාතේ යන කොට හුළඟ - උණුසුමට වින්දනය කරන්නාවූ ඒ කායික සුවය - තව විඳින්ට ලෝභ කමක් ඇතිවෙනවා. ඒ ලෝභ කම ඇති උනා කියල කියන්නේ අකුසල. ඊළඟට මොකද කරන්නේ **- 'කායිකං සුඛං උපනිස්සාය පාණං හනති, පාණං හනති අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති.........'** - ඒ කියන්නේ දැන් සත්තු මරණවා - හොරකම් කරනවා - බොරු කියනවා - කේලාම් කියනවා - සැර පරුෂ වචන කියනවා - ඊළඟට බය කරනවා - හිස් වචන කියනවා - මඟ ඉඳල ඊළඟට ගෙවල් පහරනවා - ඒවගේම ගෙවල් වලට පනිනවා - මංකොල්ල කනවා - ඒවගේම නොයෙක් ආකාරයෙන් පවුකම් කරනවනේ - අහන්ට ලැබෙනවනේ. දැන් ඔය මිනිස්සු පවු කම් කරනවනේ. දැන් ඔය මිනිස්සු හොරකම් කරනවනේ. ඒවගේම මිනිස්සුන්ට දුකක් පීඩාවක් දීල ඒ ගොල්ල සතුදේ ගන්නවනේ. ඒ මිනුස්සු සල්ලි හොයන්නේ එහෙම නැත්නම් මිනී මරල ඒ වගේ සල්ලි හොයන්නේ - එකතු කරන්නේ - අනිත් අයගේ දේවල් ගන්නේ කුමක් නිසාද? හොඳට සැපයක් විඳින්ට තියෙන ආසාව නිසා. ඒගොල්ල ඒකට මෙහෙයෙව්වේ කවුද? ආන්න අර තමන්ගේ ජීවිතියට බැඳිච්ච ඒ සැප ගතිය. ඒක නිසා අව්‍යාකෘත ධර්මය කියන ඒ විපාකය පෙර කරපු කුසලයක විපාකය මේ වෙලාවේ අව්‍යාකෘතයක් බවට පත්වෙලා ඒක තදබල විදියට හිතේ කැවිලා ඊට පස්සේ ඒක

මෙහෙයවනවා ප්‍රධාන කාරණයක් හැටියට තව අකුසල් ධර්මයන් ඇතිකරන්ට. ලෝභ හැදුව - මිනිස්සුන්ට පීඩා කරා සොරකම් කරන්ට - ඒවා අකුසල්නේ - අන්න ඇති වෙච්ච තාලේ.

දැන් බලන්න දෙව්දත් තෙරුන් වහන්සේ - දෙව්දත් තෙරුන්වහන්සේ ඔච්චර ඔය කරපු දේවල් - බුදුරජාණන්වහන්සේගේ ඇඟේ ලේ සෙලෙව්වා - සංඝ භේදය කරා - ඒ ඔක්කොම කරේ කුමක් නිසාද? අර විපාක වශයෙන් මනුෂ්‍ය ජීවිතියකට ඇවිල්ල ඊට පස්සේ පිරිසක් හදාගෙන අනිත් ඒවා එනම් බුදුරජාණන්වහන්සේගේ සිරියාව එහෙම දැක්කනේ - බුදුරජාණන්වහන්සේ වඩින විදිය - බුදුරජාණන්වහන්සේගේ ඒ කට හඬ - ඒවා විපාකනේ - බුද්ධ දර්ශනය විපාකයි - බුදුරජාණන්වහන්සේගේ කට හඬ අහන්න ලැබිච්ච එක විපාකයි. ඒවාගේම ශාසනයේ යම්කිසි දෙයක් වළඳන්ට හම්බ වෙනවානම් ඒවත් විපාකයි. ඊට පස්සේ ඒ විපාක සිත් ටික අව්‍යාකෘතයි නේ. ඒ අව්‍යාකෘත තදට ඇවිල්ලා ඊට පස්සේ තමන්ට ලෝභයකුත් ඇතිවෙනවා. තවත් හිත තියෙනවා - මෙතැනදී ඇතිවෙනවා මොකක්ද? බුදුරජාණන්වහන්සේ නසල වනසල උන්වහන්සේ පිරිනිවන් පාවලා තමන් එතැනට යන්න. දැන් ඒක නිසා කියනවා **'අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයට හේතුවෙනවා ඒ වාගේම තමයි අව්‍යාකෘත ධර්මයක් කුසල ධර්මයටත් හේතුවෙනවා'** කියල.

ඒ කුසල ධර්මයට හේතුවෙන්නේ - දැන් අපිට යම් කිසි හොඳ ප්‍රනීත ආහාරයක් වළඳන්ට හම්බ වෙනවා. හොඳ තැනක ඉන්ට හම්බ වෙනවා - ඊළඟට මේ සිත්, ඒ කියන්නේ මේ ඇහෙන් වින්දනය කරන චක්ඛු විඤ්ඤාණ ඒවත් විපාක සිත්නේ - හොඳ දේවල් අහන්ට ලැබෙනවා - ඒවා විපාක සිත් අව්‍යාකෘතයි - නහයට දැනෙන ඔය සුවඳවල් - ඒවා විපාක - අව්‍යාකෘතයිනේ. රස - ඒවා විපාක අව්‍යාකෘතයි - සම්පටිච්ඡන - සන්තීරණත් එහෙමයි. ඔය විපාක විඳින කොට අහල තිබෙන්නාවූ බණ - ඒවත් හේතුවෙලා ඊට පස්සේ මොකද වෙන්නේ 'මම මේක ලබන්ට ඕන - මම මේවගේ ටිකක් තව ලබන්ට ඕනෑ කියල' ඊට පස්සේ මොකද කරන්නේ දානේ දෙන්ට - මිනුස්සුන්ට උදව් උපකාර කරන්ට - ඒවාට පෙළඹෙන්න පුළුවන්. ආන්න එහෙම පෙළඹෙන කොට - දානේ දෙන්නේ ඇයි? දානේ දෙන්නේ තව තව දේවල් ලබාගන්න. දැන් අව්‍යාකෘත ධර්මයක් නිසා තවත් ඒවගේ දේකට උපකාරක ධර්මයක් - ප්‍රත්‍යය ධර්මයක් වෙන විදිය තමයි ඔය කියන්නේ.

තව එකක් තිබෙනවා - දැන් ඔය ගෙවල් දොරවල් තියෙනවනේ - මිනුස්සුන්ට දකින්ට එහෙම ලැබෙනවනේ ඔය suburbs වල ලස්සනට හදපු - ලස්සන පාට ගාපු ගෙවල් දොරවල් මාලිගා වගේ එහෙම ඒවා දකින්ට ලැබෙනවා නම් ජරා ගොඩක් නොවී හිත කසල කරන්නාවූ දෙයක් නැතුව යම්කිසි හොඳ දර්ශනීය තැනක් දකින්ට ලැබෙනවා නම් ඒ කුසල විපාක. ඒ කුසල විපාකයක් ආවට පස්සේ ඒ කුසල විපාකය මුල් කරගෙන ඊට පස්සේ මොකද කරන්නනේ 'මමත් ඒවගේ ගෙයක් ගන්න ඕන - මම හොඳට පිං කරන්ට ඕන' කිය කියා ඒ කුසල හිත

හැදෙන්නේ අර අව්‍යාකෘත ධර්මය මුල් කරගෙනයි. **'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො'.**

ඊළඟට තියෙනවා තව කෑල්ලක් **'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො'** – 'ප්‍රධාන හේතුවක් හැටියට ප්‍රකෘතියෙන්ම ඒක මතක් වෙලා තමන්ව ඒකට පොළඹවනවා.

අනිත් එක තමයි ඔය කිව්වනේ සෘතුව - අපි හිතමු මෙහෙම දැන් තමන්ගේ ඉන්න තැන සීතලයි. සීත රටවල් වල ඉන්නව කියමුකෝ - දැන් මෙහෙ නවසීලන්තය සීතලයි. මේ සීතල කියල කියන්නේ කුසලයක්වත් අකුසලයක්වත් නෙවෙයි. ඒක සෘතු ගුණයක්. ඒක රූප වලට අයිති වෙන්නේ. අව්‍යාකෘත ධර්මයක්. ඒ අව්‍යාකෘත ධර්මය අපිට විඳින්ට හම්බ වෙනවා යම්කිසි තැනකදී. ඒක සියුම්ව බැලුවොත් එහෙම ඒ රූපය පහළ වෙලා යම්කිසි තැනකදී තමයි අපිට ඒක විඳින්ට හම්බවෙන්නේ. එතකොට ඒක ඇති උනායින් පස්සේ අපිට සීතලයි - පීඩාවක් - දැන් ඒක කායික අපහසුක් - ඊට පස්සේ ඒක මෙහෙයවනවා කොහේ හරි තිබෙන්නාවූ heater යක් හොරකම් කරගන්න. ඒ heater හොරකම් කරගන්නේ ඇයි? තමන්ට අර දුකෙන් අයින් වෙලා උණුසුම ලබාගන්න. දැන් ඒක හැදුවේ කවුද? ඒක මෙහෙයවූයේ කවුද? ඒක මෙහෙයවන්න හේතු උනේ -ප්‍රධාන උපනිශ්‍රය ස්වභාවයක් ඇතිකරලා - ප්‍රකෘති උපනිශ්‍රය ස්වාභවයෙන් හේත්තු උනේ මෙන්න මේ කියන සෘතු ගුණේ - අව්‍යාකෘත ධර්මය. ඒකට කියනවා **'අව්‍යාකෘත ධර්මයෝ අකුසල ධර්මයන්ට උපනිශ්‍රය ස්වාභවයෙන් ප්‍රත්‍යය වෙනවයි'** කියල.

තව එකක් තියෙනවා - කෑම බීම අපි කිව්වා - ඔය ගෙවල් දොරවල් - සේනාසන - ස්වාමීන්වහසේලාටත් ඔය පන්සල් - සේනාසන - ආරාම ඒවා හම්බ වෙන්නේ සහ ලැබෙන්නෙත් - ඒවා සාසනික වශයෙනුත් ලැබෙනවා ස්වාමීන්වහන්සේලාගේ පිනටත් හම්බවෙනවා. ඒක සමහර අවස්ථාවලදී කියන්ටත් අමාරුයි. මේක සාසනේටම හම්බවෙනවද එහෙම නැත්නම් ස්වාමීන්වහන්සේ සාසනේට හම්බවෙන දේ මුල්කරගෙන ඉන්නවද නැත්නම් ස්වාමීන්වහන්සේට හම්බවෙන දේ කොටසක් සාසනේට යනවද කියල හිතනකොටත් එක එක පැටලවිලි එනවා. හැම දෙයක්ම සාසනේට තමයි හම්බ වෙන්නේ හැබයි සාසනේට ලැබෙනවා වගේම ඒ ස්වාමීන්වහන්සේගේත් පිනක් තියෙන්ට ඕන සාසනේ ඉන්දෙද්දී උනත් ඒ විපාකය විඳින්ට. ඔය හැමදේම සාසනේට හම්බ වෙනවා - බුදුරජාණන්වහන්සේගේ කුසල බලයට - පාරමී ශක්තියට - ඒවාගේම එතෙන්ට - ඒ කුසලය විඳින අවස්ථාවේදී ඒ ස්වාමීන්වහන්සේටත් කුසල් තියෙන්න ඕනෑ. ඒක නිසා මේ සේනාසන - පන්සල් - ආරාම - කුටි මේ සියල්ලක්මත් ලැබෙන්නේ විපාකයක් හැටියට. එහෙම විපාකය ලැබෙන තවත් හාමුදුරුවෝ කෙනෙක් දැක්කොත් ඒක හිතල ඊට පස්සේ ඒකෙන් තව කුසල්

වඩනව ඒක ලබා ගන්න. හැබැයි ඒ ස්වාමීන්වහන්සේලා නම් ඔය අනිත් විදියට හොරකම් කරන්ට යන්නේ නැනේ කාගෙවත් දෙයක්. ඒක නිසා ප්‍රාර්ථනා කරනවනේ.

එක්කෙනෙකුට හැදුනා cancer එකක්. cancer එකක් හැදිලා ප්‍රාර්ථනාවක් කරා. Cancer එකෙන් හැදෙන්නාවූ වේදනාව කායිකයි - ඒක කායික දුක්ඛයක් - ඒ කායික දුක්ඛය හරියට හිතේ කැවුන - එයා ප්‍රාර්ථනා කරනවා "මේ කායික දුක මාව බලන්ට එන කිසිකෙනෙකුට නොලැබවේවා - මේ වගේ දුකක් කිසිම සත්වයෙකුට නෑදෑයෙකුට විදින්ට නොලැබවේවා" කියල මේ විදියට ප්‍රාර්ථනා කරනවා. ඒක තරහෙන් කරන එකක්ද? මේක ද්වේශයෙන් ඊර්ෂ්‍යාවෙන් කරන එකක්ද? තමන් විඳ විඳ අනිත් අයට පතන එක? හේතුව මේ cancer එකක් හැදිලා ඒ විඳින වේදනාව කායිකයි - විපාකයි - අව්‍යාකෘතයි. ඒ අව්‍යාකෘතය ඒ ලෙඩාව මෙහෙයවනවා මෛත්‍රී පූර්වාන්ගම කුසලයක් හදන්න. අනිත් එක්කෙනාට මෙහෙම වේවා කියල පතන්නේ නැහැ. ලෙඩ වෙලා ඉඳගෙන හරි අනිත් එක්කෙනාට 'මට මෙහෙම උනාට වෙන කෙනෙකුට මෙහෙම වෙන්න එපා' කියල කියන්නේ **'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො'** - ඒක ප්‍රධාන කාරණයක් වෙනවා. ඒක හිතේ කැවිලා - ඒක එහෙම වෙන්ට එපැයි කියල.

ඊට පස්සේ තියෙනවා හේතු ප්‍රත්‍යය ධර්‍ම තියෙනවා - අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය තියෙනවා - ඊළඟට උපනිශ්‍රය ස්වභාවය තිබෙනවා - හැබැයි ගොඩක් ඕක අස්සේ තියෙනවා. හැබැයි මේ ධර්‍ම කාණ්ඩය යටතේ අපි එකයි ඉස්මතුකරලා කථා කරන්නේ මේ ධර්‍මය තේරුම් ගන්න ඕන නිසා - ඒ තමයි උපනිශ්‍රය ධර්‍ම ස්වභාවය.

ඊළඟට මේ අපිට ඇසුරු කරන්න ලැබෙන පුද්ගලයෝ. **'පුග්ගලොපි උපනිස්සයපච්චයෙන පච්චයො'** කියන්නේ - දැන් අපිට හොඳ කෙනෙක් දකින්න ලැබෙනවා. දැකල එයා ඉතින් හොඳයි. හරි යහපත්. ප්‍රසිද්ධයි. උසයි මහතයි ඉතින් මේ මනුස්සයගේ රූපයනෙ දකින්න ලැබෙන්නේ. එයාගේ ගුණ යහපත් බවත් අහන්න හම්බවෙනවා. දැක්කහම අනේ මටත් මේවගේ වෙන්ට ඇත්නම් කියල හිතේ කැවිලා ඊට පස්සේ හොඳ පැත්තට ගියොත් - කුසලයක් ඇතිකර ගත්තොත් - ඒ අව්‍යාකෘත ධර්‍මය පකති වශයෙන් ඇවිල්ල උපනිශ්‍රය වෙනවා කුසලයකට. ලෝභ කරොත් එහෙම නැත්නම් ඊර්ෂ්‍යා කරොත් අනේ මේ මනුස්සයාට මේ විදියට උනානේ කියල මේයාට මෙච්චර එපැයි කියල ද්වේශයක් ඇති උනොත් එහෙම ඒක උපනිශ්‍රය වෙනවා අකුසලේට.

අව්‍යාකෘත ධර්‍ම - රූප කියල කියන්නේ අව්‍යාකෘත ධර්‍ම. දැන් අපි නිවන පිළිබඳව අහල නිවනක් ප්‍රාර්ථනා කරගෙන නිවනක් අපේක්ෂා කරගෙන අපි මේ කුසල ධර්‍මයන් වඩනවා. දැන් මේ පින්වතුන් මේ රාත්‍රී කාලය ගතකරන්නේ. දැන් මෙහෙ රෑ එකොළහත් පහුවෙලා

නමුත් මේ පින්වතුන් ඕස්ට්‍රේලියාවේ ඉන්නවනම් ඒ රටවල වෙලාව වෙනස්. සමහර අයට දවල් සමහර අයට හැන්දෑවේ සමහර අයට උදේ - ඉතින් වෙන වැඩක් නොකර ඔක්කෝම ටික අත්හැරලා දාල දැන් මේ සියලුම දේවල් වලින් බැහැර වී මේ බණ අහන්නේ අපි මේ ධර්ම සාකච්ඡා කරන්නේ - කථා කරන්නේ - හිතන්නේ - මෙනෙහි කරන්නේ - නිකං අපි පට්ඨාන ධර්මය කථා කරන පිරිසක්ය කියල නිකං අමුතු නමක් හදාගන්ටද? එහෙම නැත්නම් වෙන අමුතු බ්‍රහ්ම ලෝකයක විශේෂ උප්පත්ති බලාගෙනද? නැනේ. දිව්‍යලෝකේ යන්නද? නැනේ. මනුස්ස ලෝකෙට එන කොට ආයේ අමුතු විදියකට එන්නද? නැනේ. මේ ධර්මය අහන්නේ අපි අව්‍යාකෘත ධර්මයක් ගැන හිතපු නිසා - අහන්ට ලැබිච්ච නිසා - ඒ අහපු දේ අපේ හිතේ කැවිලා තියෙන නිසා - ඒ තමයි නිර්වාණ ධාතුව. නිර්වාණ ධාතුව ඇවිල්ල කුසලයක් නෙමෙයි. නිර්වාණ ධාතුව ඇවිල්ල අකුසලේකුත් නෙමෙයි. නිර්වාණ ධාතුව අව්‍යාකෘත ධර්ම ස්වභාවයක්. ඒ අව්‍යාකෘත ධර්ම ස්වභාවය අවබෝධ කරගන්ට පැතුම් වශයෙන් - වැඩීම් වශයෙන් දැන් මේ බණ අහනව. දැන් බලන්ට මේ අව්‍යාකෘත ධර්මයක් පිළිබඳව හිතල - ශ්‍රද්ධාව හැදිලා - ඒ පිළිබඳව හොඳ ඕනෑ කමක් හැදිලා - ප්‍රකෘති වශයෙන් අපිව මෙහෙයවන විදිය. දැන් ඕක පුරුදු උනායින් පස්සේ - පෙළ ගැහිලා ගියැන් පස්සේ හැම සතියකම - හැම මාසයකම 'අනේ මේ වෙලාවට මෙහෙම එකක් තියෙනවා අහන්ට ඕනේ - යන්ට ඕනේ කියල මෙහෙයවල අව්‍යාකෘත ධර්මයක් කුසලකට හරවන උපනිශ්‍රය වෙන විදිය තමයි ඔය මතක් කරේ.

අපි මේ වෙලාවේදී මේ පින්වතුන්ට අවස්ථාව සලසා දෙනව තවත් ටිකක් මේ පිළිබඳව භාරලා අවුස්සලා හිතල ඒවාගෙන් අව්‍යාකෘත ධර්ම පිළිබඳව මේ උපනිශ්‍රය ධර්ම ස්වභාවය එන තාලේ ගැන හිතල තව ප්‍රශ්න එහෙම තියෙනවා නම් ඒවටත් පිළිතුරු හොයා ගන්න. කුසලයට අකුසලයට මේක බලපාන විදිය -කායික වශයෙන් ඇතිවෙන්නාවූ සැපත් - දුකත් - ඊළඟට විපාක සිතුත් - අපි කන බොන දේවල් - ඊළඟට වටපිටාවේ දකින්න ලබෙන දේවල් - මෝහයට - ලෝභයට - මාන්නයට - දෘෂ්ටියට ඒවා උපනිශ්‍රය වෙන ස්වභාවය තමයි අපි මේ කථා කලේ. අනිත් එක තමයි - ඒ ප්‍රකෘතියෙන් ඇතිවෙන විශේෂ ශ්‍රද්ධාවක් තියෙනවනේ.

තව එකක් කියන්න ඕන මෙහෙම. දැන් අපිට, මිනිස්සු හැටියට විශේෂයෙන්ම දකින්න හම්බවෙන්නේ ඉස්සෙල්ලාම රූපයනේ. ඔය මිනිස්සුන්ගේ තියෙනව රූපමය ආකාර විශේෂයක් - ගුණ විශේෂයක් තියෙනවා. අමුතු හරි ශාන්ත ස්වභාවයක්. දැන් මේ කථාව කියන කොට තමයි මට මතක් උනේ මම පොඩි කාලේ මහණ වෙලා නෑ - ළමා කාලේ මම දකිනවා ස්වාමීන්වහන්සේ නමක් පාත්තරයක් අරගෙන පිණ්ඩපාතේ වඩිනවා. හරිම ශාන්තයි. හරිම ශාන්තයි නිස්කලංකයි. ඉතින් ඒ ස්වාමීන්වහන්සේ ඒ පිණ්ඩපාතේ වඩිනවා දක්කයින් පස්සේ උන්වහසේගේ ශරීරය විපාකයක්නේ - ඉතින් උන්වහන්සේගේ ඒ ගමන් විලාසය දක්කයින් පස්සේ - ඒ යන ස්වභාවය දැක්කයින් පස්සේ ඒ දර්ශනය කෙරේ හරිම ශ්‍රද්ධාවක් ඇති වෙනවා. ඒ ශ්‍රද්ධාව ඇති උනේ කුමක් නිසාද? ඒ උන්වහන්සේගේ දර්ශනය දැකල. ඒ ශ්‍රද්ධාව ඇති උනායින් පස්සේ ඒක තව තව - තව තව තරවෙලා - තරවෙලා ගිහිල්ල මට හිතුන මහණවෙන්න. ඒක විතරක් නෙමෙයි තවත් කරුණු කාරණා යෙදුන.

මේක උලුප්පවල දුන්න. එතකොට බලන්න අව්‍යාකෘත ධර්මයක් අපේ මනසට උපනිශ්‍රය කරන්ට ඉදිරිපත් වෙන උපකාරවෙන ස්භාවය. ඔන්න ඔය විදියට තමයි හිතට කැවිච්ච දෙයක් - හිතින් ගරු කරලා ගත්ත දෙයක් ඊළඟට විශේෂයෙන්ම අරමුණු වශයෙන් එනවා. අනන්තර වශයෙන් එනවා - ප්‍රකෘති වශයෙන් එනවා. ප්‍රකෘති වශයෙන් එන්නේ අපේ හිතේ පහළ වෙන්නාවූ ශ්‍රද්ධාදී ධර්ම - කුසල වශයෙන්. අනිත් ඒවා තමයි අකුසල ධර්ම - අකුසල වශයෙන්.

ඉතින් මේ ටික තමයි මම මේ වේලාවේදී මේ පින්වතුන්ට මතක් කරේ කෙටියෙන් අර ඉතිරි තිබ්බ්ච්ච නිසා. හැබැයි මේක අවසාන නෑ. අපි ඉස්සරවෙලා මේ විදියට chart එක දාගෙන යනවා. මේ 24 chart එක දාගෙන ඉවරකරගෙන ගිහිල්ල ඊළඟට ඉදිරිපත් වෙන්නේ ඊළඟ ප්‍රත්‍යය. ඒකට කියනවා 'පුරේජාත ප්‍රත්‍යය' කියල. ඊළඟට අව්‍යාකෘත ධර්ම ටිකත් මේ විදියට තේරුම් අරගෙන 24 ම ගිහිල්ලා තව තියෙනවා සලකන විදියක් - එක්කාසු කරලා බලන විදිහක් තිබෙනවා. එතෙන්ට එනකල් අපි ඉවසීමෙන් මෙහෙම කරගෙන යමු. සැමදෙනාටම ධර්ම අවබෝධය - නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා!

මේ ගාථාව හොඳට හිතන්ට. අපේ ගෞරවණීය ස්වාමීන්වහන්සේ විස්තර කරනවා - **'අවික්ඛිත්තා නිසාමෙථ, දුල්ලභා හි අයං කථා'** – 'මේ අභිධර්ම විස්තරය - මේ විදියට මේ කියල දෙන මේ කරුණු හරි දුර්ලභයි. අතිශය දුර්ලභයි'. සැමදෙනාම බොහොම ඉවසීමෙන් අහගෙන වික්ෂිප්ත නැති සිතකින් අහන්න කියන එක කියනවා. ඉතින් මේ පින්වතුන් ඕනෑකමින් ශ්‍රද්ධාවෙන් අහන්නේ ඒ දුර්ලභ ධර්මයයි. ඒක නිසා වෙසක් කාලේ ධර්මය මේ විදියට මෙනෙහි කරමින් කුසල ධර්මයන්ට පහළ වෙන්ට ඉඩහරිමින් ඒ කුසල ධර්මයන් තව තව ඉදිරියේදී වැඩෙන්නාවූ අව්‍යාකෘත ධර්මයකට එළිපෙහෙළි කරමින් දියුණු කරගෙන මාර්ගය වඩාගෙන අප සැම දෙනාටම නිවනින් සැනසෙන්ට මේ පින - මේ කුසලය හේතු වසනා වේවා කියල අධිෂ්ඨාන කරගනිමු. මේ පින්වත් සැම දෙනාටම මේ ධර්ම මාර්ගයේ තව තව තීක්ෂණ තියුණු විදියට පවත්වාගෙන ගුණ වඩාගෙන නිවනින් සැනසෙන්ට ලැබේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. හැම දෙනාටම තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි! සවාමීන්වහන්ස අනන්ත අප්‍රමාණ පිං ඔබ වහන්සේට අපිට අද කරපු අනුග්‍රහයට.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස කෙටියෙන් පොඩි ප්‍රශ්නයක් දෙකක් අහන්න තියෙනවා. අනිත් කල්‍යාණ මිත්‍රයන්ටත් ඇති. ස්වාමීන්වහන් දැන් අව්‍යාකෘත ධර්ම කියනකොට අපි රූපය පිළිබඳව කථා කළා ඒවාගේම විපාක පිළිබඳවත් කථාකළා. අපි අර විපාක ත්‍රිකය ගත්තහම **'විපාකා ධම්මා – විපාකධම්මධම්මා – නෙවවිපාකනවිපාකධම්මධම්මා'** කියන කොට එතනදී රූපය කියන එක විපාක ධර්මයක් නොවෙන බව අපි තේරුම් අරන් තිබ්බ ස්වාමීන්වහන්ස. ඒවගේම දැන් අපි දානයක් දීල පින්දහම් කරනකොට අපිට කියනවනේ ආයුෂ වර්ණය සැපය බලය ලැබේවා කියලනේ කියන්නේ කුසලය හේතු කරගෙන. එතකොට කොහොමද ස්වාමීන්වහන්ස අපි මේ රූපය කියන එක - දැන් සූත්‍ර දේශනාවල තියෙනවා විපාකයක් හැටියට පිළිගන්නවා කියල නමුත් අපි දන්නවා ධර්මානුකූලව රූපය කියන එක විපාකයක්

හැටියට පිළිගැනීමක් වෙන්නේ නැහැයි කියල. එතන අපිට පොඩ්ඩක් පැහැදිලි කරගන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - විපාක හැටියට ගණන් ගැනෙන තෝරා ගන්ට අමාරු නෑ මේක. විපාක හැටියට ගණන් ගැනෙන ටිකක් තියෙනවා. ඇත්ත වශයෙන්ම ඒ **'විපාක ධම්මා විපාකධම්මධම්මා නෙවවිපාකනවිපාකධම්මධම්මා'** කියන ඒ ධර්මතා ත්‍රිකයේ නාම ධර්ම තමයි මුල් කරන්නේ - නාම ධර්ම හැටියට මුල් කරනවා. ඒකෙ කියන්නේ විශේෂයෙන්ම රූප වෙන්කරනවා. හැබැයි දැන් අද කියල දුන්නා මේ පින්වතුන්ට විපාක සිත් තියෙනවා 36 ක් ඒ 36 යේ විපාක ධම්මා කියල කියන්නේ ඒ ඇතිවෙන්නාවූ ධර්ම ස්වභාවයට - අහේතුක ටිකයි කුසල 8 යි රූපාවචර සහ අරූපාවචර අනිත් එක එතන ගන්නවා ලෝකෝත්තර සිත් ටික. දැන් ඒ සිත්ටික ගත්තයින් පස්සේ ඒක අස්සේ තියෙනවනේ විඤ්ඤාණ ටිකක් - අහේතුක විපාක විඤ්ඤාණ තියෙනවනේ. ඒවගේම තමයි තියෙනවනේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් - භවංග සිතක්- චුති සිතක් - ඒවත් ඇවිල්ල විපාකනේ මහත්තය - නාම ධර්ම. නාම ධර්මයි ගන්නේ. දැන් මෙතන ඒ විපාක කථාවයි විපාක උපදවන්නාවූ සිත්වලට කුසල හෝ අකුසල හෝ වෙනවා.

දැන් එතන එහෙම කිව්වා දැන් මෙතනදී අව්‍යාකෘතයි කියල කියන්නේ අව්‍යාකෘත කථාවේදී ඒක සිතක් වෙන්න පුළුවන් ඒක චෛතසික වෙන්ට පුළුවන් ඒක රූප වෙන්ට පුළුවන් - අව්‍යාකෘත ධර්මවල ඔක්කොම ටික රූපත් අන්තර්ගත කරනවා. දැන් ඔය පටලැවිල්ල මම හිතන්නේ එන්න ඇත්තේ මම අර කිව්වනේ කෙනෙකුගේ ආහාර පාන ආදිය දේවල් හේතුකරගෙන අරෙහෙමෙහෙ වෙනවයි කියල. මේ උපනිශ්‍රය ස්වභාවයට වෙන තැනයි මම මේ කියන්නේ. සමහර ප්‍රත්‍යය ධර්මවල තිබෙනවා - මාතෘකාවට හරියට හිත යොදන්න වෙනවා - ඒකෙ අන්තර්ගත ධර්මය පටලැවෙන්න පුළුවන් නැත්නම්. විපාක ධර්ම පිළිබඳව කියන කොටයි අබ්‍යාකතා ධර්ම පිළිබඳව කියන කොටයි සමහර වෙලාවට හේතු ධර්ම ගැන කියන කොටයි හරි සමාන ගතියක් යනවා. සමහර වෙලාවට කෙනෙකුට හිතෙන්ට පුළුවන් මේ හේතු ප්‍රත්‍යය ධර්මයන් වලත් මේ විදියට නේද තිබුනේ කියලා. යම්කිසි ආහාරයක් අපි හිතමු ලුණු කියල. ලුණු අහාරයකට දැම්මොත් එහෙම එතකොට වෙන එකක්. ඊළඟට බෙහෙතකට දැම්මොත් එහෙම ඔය ලුණු ඖෂධයක්. සමහර වෙලාවට එතකොට ලුණු එක තැනක තියෙනවා, කෑමක්ය කියල - එක තැනක තියෙනවා, බෙහෙතක්ය කියල - ඊළඟට සමහර වෙලාවට ලුණු වෙන මොහොකට හරි බාහිර දෙයකට යෙදුවොත් එහෙම ඒකේදී වෙන නමක් කියනවා. ආන්න ඒවගේ. හැබැයි එතැනදී සමාන කමකුත් තියෙනවා අසමාන කමකුත් තියෙනවා. මාතෘකාවේ හැටියට තමයි පරෙස්සමෙන් පටලැවෙන්නේ නැතුව තේරුම් ගන්න ඕනෑ වෙන්නේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස එතන ඇත්තටම පටලැවිල්ල කියල ප්‍රශ්නයක් උනේ ස්වාමීන්වහන්ස එතන රූපය කියන එක විපාකයක් හැටියට බාර ගන්න පුලුවන්ද කියන එක තමයි විශේෂයෙන්ම ප්‍රශ්නය උනේ ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - විපාක මාතෘකාවේ හැටියට - දැන් මෙහෙම එකක් තියෙනවා මහත්තය දැන් අර බලන්න මාතෘකාවේ විපාකා ධම්මා - විපාකධම්මධම්මා - කියන එක මේකට දාගත්තොත් ප්‍රශ්නේ එනවා. එතකොට කර්මයක් සිද්ධ කරායින් පස්සේ කර්මයෙන්

උපදවනවා කර්ම සමුට්ඨානික රූප ස්වභාවයක්. දැන් අපේ ඇහැ ඇයි මේ විදියට තියෙන්නේ? අපි කරපු හොඳ කුසලයක්. ඒකෙ විපාකයේ හැටියට කර්ම සමුට්ඨානික එකක් තියෙනවා. හැබැයි කුසල කර්මය හේත්තුවෙලා ඒකෙ විපාක හිතත් එක්ක නිෂ්පාදිත වූ කර්ම සමුට්ඨානික රූපයක් තිබෙනවා. හැබැයි අතනදී කථා කරන්නේ නෑ ඒ විදියට. දැන් බලන්ට ඇස කන නාසය දිව ශරීරය කියන ඒවා ප්‍රසාද. ප්‍රසාද ඇවිල්ල ඒවගේ එක්තරා විදියක කර්ම සමුට්ඨාන ස්වභාවයක්නේ තියෙන්නේ. අන්න ඒකයි.

ස්වාමීන්වහන්ස එතකොට වර්ණය කියනඑක කොයි ආකාරයෙන්ද? ඒකට කර්ම බලපානවා කියල හිතෙනවා විශේෂයෙන් තරහ යන කෙනෙක් දුර්වර්ණ වෙනවා වගේ කියල ඒකත් එතකොට යම්කිසි විදියක කර්ම බලපෑමකින් නේද ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහසේ</u> - අව්‍යාකෘතයි - මෙහෙමයි මේක කියන්ට ඕන. දැන් බලන්ට රූපවල තියෙනවා මහත්තයා ගොරෝසු රූප සහ සුක්ෂම රූප තියෙනවා. ඒවගේම තියෙනවා රූපවල ද්වාර ගෝචර රූප තියෙනවා ද්වාර වලට ගොදුරු වෙන්නේ නැති ධර්ම ආරම්මණ හැටියට කියන්නාවූ රූප තියෙනවා. දැන් අපිට වර්ණය දකින්ට පුළුවන් - ඒක ඇවිත් ද්වාර රූපයක්. ඒ කියන්නේ ගෝචර රූපයක්නේ, ශබ්දයත් ගෝචරයිනේ - අනිත් එක ඔයවගේ බෑනේ අපිට ප්‍රසාද රූප ගන්න. ප්‍රසාද රූප අතිශය සියුම් - ප්‍රසාද රූප ඇවිල්ල දකින්නත් බෑ - ප්‍රසාද රූප ටික ඔක්කොම ඇවිල්ලා හෘදය වස්තු රූපයත් එක්ක ඔක්කෝම නිකං හැදෙන්නෙත් නෑ. එතකොට ඒවා කර්ම සමුට්ඨානයි. කර්ම සමුට්ඨානික වෙන්ට නම් ඒකෙ ඒ ඇහැ හදන ප්‍රසාද රූප හදන්නාවූ කර්ම සමුට්ඨානය නිෂ්පාදනය කරල දෙන්නාවූ ශක්තියක් තිබෙන්නාවූ කුසල කර්ම - ධර්ම තියෙන්ට ඕනෑ. එක විදියකට කථා කරනකොට විපාක ස්වභාවයක්. විපාකයක් හැටියට මේක ඇතිවෙනවා හැබැයි විපාකා ධම්මා විපාක ධම්මධම්මා කියන තැන ඇත්තටම පිරිසිඳු විපාක ධර්මයෝ කියල ගණන් ගන්නේම නාම ධර්ම විතරයි.

හොඳමයි ස්වාමීන්වහන්ස අප්‍රමාණ පිං. ස්වාමීන්වහන්ස තව පොඩි ප්‍රශ්නයක් තියෙනවා මෙතන අර **'පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො'**කියන එක අපි විස්තර කර ගත්තද කියන එක මට පොඩ්ඩක් ප්‍රශ්නයක් උනා ස්වාමීන්වහන්ස. අපි කුසල අකුසල ධර්ම අපි කථා කරා අබ්‍යාකතා ධම්මා වලින් මේ අබ්‍යාකතයක් අබ්‍යාකතයකටම උපනිශ්‍රය වෙන ආකාරය උදාහරණයකින් කියන්න පුලුවන්ද ස්වමීන්වහන්ස

<u>ස්වාමීන්වහන්ස</u> - ඒක අමාරු නෑ මහත්තය ඒක අපිට ගැලපෙනවා. දැන් බලන්න රහතන් වහන්සේලාගේ පිළිවෙත. රහතන්වහන්සේලාගේ සිත් රහතන් වහන්සේලගේ තිබෙන්නාවූ ආකාර ස්වරූපය - එතකොට ක්‍රියාසිත් ඔක්කෝම අව්‍යාකෘත ධර්මනේ. ඊළඟට ඔක්කොම විපාක සිතුත් අව්‍යාකෘත ධර්මනේ. එක දවසක් මට ස්වාමීන්වහන්සේ නමක් දකින්ට ලැබෙනවා. ඒ ස්වාමීන්වහන්සේ දැක්කයින් පස්සේ ඒ ස්වාමීන්වහන්සේගේ පිළිවෙත හරී ශාන්තයි. සුදු හාමුදුරුවෝ කෙනෙක්. හැබැයි ඒ ස්වාමීන්වහන්සේ රහතන්වහන්සේ නමක් නෙමෙයි. ඒ ස්වාමීන්වහන්සේ බොහෝම නිස්කලංකව බොහොම නිස්පාසුවේ කිසිම දෙයක් ගණන් නොගෙන මම හිතන්නේ ඒ ස්වාමීන්වහන්සේ මම දිහා බලාගෙන විදර්ශනා

මනසිකාරයක හිටිය ආකාරයක් තමයි මට පස්සේ තේරුනේ. තරහ අමනාපයකුත් නෑ හිතවත් කමකුත් නෑ හරීම මධ්‍යමයි. මම රහතන්වහන්සේ කෙනෙක් ගැන හිතනවා - යම් කිසි දවසක මම රහතන්වහන්සේ නමක් දැක්කොත් එහෙම රහතන්වහන්සේගේ හිතත් මා කෙරෙහි කිසීම දවසක ඇලීමක් කිසිසේත්ම පිහිටන්නේ නෑ. මට එහෙම දකින්ට ලැබුනොත් එහෙම ඔය විදියට රහතන්වහන්සේගේ පැවැත්ම - උන්වහසේගේ හිත - උන්වහන්සේගේ ඒ තිබෙන්නාවූ ස්වභාවය - මට හිතට දැනුනොත් එහෙම මම ඇත්ත වශයෙන්ම ඒක මට හිතුනයි කියල - මගේ හිතට උන්වහන්සේ කෙරෙහි ප්‍රසාදයක් ඇති උනාට - ඒ උන්වහන්සේගේ පිහිටා තිබෙන්නාවූ ධර්මය කෙරෙහි - අව්‍යාකෘතයෙහි - ක්‍රියා සිත් කෙරෙහි - ඒ උන්වහසේගේ තිබෙන්නාවූ පිළිපැදීම කෙරෙහි - මගේ පැහැදීමක් ඇතිවෙනවා. ඇත්තටම ඒ සිත ගැන මම හිතුවොත් එහෙම ඇත්තටම ඒක අව්‍යාකෘතයි. අව්‍යාකෘත ස්වභාවයක් තියෙන්නේ. ඉතින් මම ඒ අව්‍යාකෘත ධර්මය මුල් කරගෙන මගේ හිතේ කුසලයක් හැදුනොත් එහෙම **'අබ්‍යාකතා ධම්මා කුසලා ධම්මා'** වෙනවා. රහතන්වහන්සේ නමක් ඒ විදියටම හිතනවා රහතන්වහන්සේ නමක් පිළිබඳ. දැන් බුදුරජාණන්වහන්සේ ඔය සැරියුත් ස්වාමීන් වහන්සේ ගැන හරියට වර්ණනා කරනවා. එතකොට සැරියුත් සවාමීන්වහසේ මුගලන් ස්වාමීන්වහන්සේ ගැන හරියට වර්ණනා කරනවා. ඉතින් අපි වගේ නෙමෙයි උන්වහන්සේලාගේ සිත් සියල්ලක්ම අව්‍යාකෘතයි. ක්‍රියා ස්වභාවය. එතකොට ඒ වර්ණනා කරන්නාවූ වර්ණනා කිරීම තුල උන්වහන්සේලාගේ හැකියාවල් උන්වහන්සේලාගේ තිබෙන්නාවූ ඒ ඉර්ධි ප්‍රාතිහාර්යය ධර්ම පිළිබඳව බුදුරජාණන්වහන්සේ තව කෙනෙකුට කිව්වත් දේශනා කරත් ඒ දේශනාවල් සියල්ලක්ම, අර රහතන්වහන්සේලා කියල කිව්වට අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයක් බවට පත්වෙනවා. අබ්‍යාකතා ධර්මයක් අබ්‍යාකතා ධර්මයකට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ආන්න ඒ විදියට තමයි මහත්තය ඕක තේරුම් ගන්ට ඕන. තව එකක් මහත්තය අපි කථා කලානේ මාතිකා 22 යි තව තියෙනවා සමහර ධර්ම ඒවා එකමයි. සමහර ඒවා එකමයි, නම් විතරයි වෙනස්. සමහර ඒවා තියෙනවා කෙස් ගහක විතර පොඩ්ඩක වෙනසක් තියෙනවා අනිත් ඒවා ඔක්කොම එකයි. ඒකත් අපි අවස්ථානුකූලව මාතෘකාවකට ආවම හරි පරෙස්සමෙන් ඒ වෙනසත් දකින්ට අපි අදිෂ්ඨාන කරගනිමු. ඒ ශක්තිය හැම එක්කෙනාටම ලැබේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

බොහොම පිං ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි සවමීන්වහන්ස බොහොම සතුටුයි ඔබ වහන්සේට සවන් දෙන්ට ලැබීම ගැන. ඔබවහසේගේ පැහැදිලි කිරීම් හරි පහසුයි තේරුම් ගන්න. සමාවෙන්න ඕන කලින් විස්තර කරලා තියෙනවනම් මට නිශ්‍රය - උපනිශ්‍රය කියන දෙකේ වෙනස පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න පුලුවන්ද? තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - නිස්සය උපනිස්සය කියන එක. අපි ඕක දාමුද අපේ මණ්ඩලයට.

ප්‍රධාන කාරණය උපනිස්සය. උපනිශ්‍රය ප්‍රත්‍යය යෙහි තිබෙනවා යමක් ඇති වීමට ඇතිවෙන්නාවූ ප්‍රධාන කාරණය. උපනිශ්‍රය. හැබැයි නිශ්‍රය කියන එකේ තියෙන්නේ මහත්තය භූමිගත වෙනවා කියන එකයි. ඒක අපි මුලදී කියල දුන්නා උපමාවක් මතක ඇති. ඒ උපමාව ඇවිල්ල යම් කිසි චිත්‍රයක් අඳින කොට චිත්‍රයේ ඇඳෙන්නේ තව එකක් මත. එතකොට ඒක

වගේ තමයි භූමියක් වෙන - යම්කිසි දේකට නිශ්‍රය - භූමියක් වෙන්නාවූ ප්‍රධාන හේතු කාරණයක් වෙන්නාවූ දේ. මේ උපනිශ්‍රය කියන එකේ තියෙන්නේ දැන් අපි හිතමු - මට මතකයි උපමාවක් කිව්වා දුටුගැමුණු රජ්ජුරුවෝ ගැන. දුටුගැමුණු රජ්ජුරුවෝ රුවන්වැලි සෑය හදනකොට දුටුගැමුණු රජ්ජුරුවෝ හැදුව කියල තමයි කියන්නේ. දැනට උනත් කියන්නේ. දුටුගැමුණු රජ්ජුරුවෝ ඇවිල්ල මේසන් බාස් කෙනෙක් නෙමෙයි. රට පාලනය කරන රජ කෙනෙක්. ඕකට අලි ඇතුන් මිනිස්සු ඔය ගොඩක් එකතුවෙලා තමයි ඕක හදල තියෙන්නේ හැබැයි ඔය මිනිස්සුන්ගේ මේසන්ලගේ ඔය වැඩේ කරන්ට ප්‍රධාන හේතුව හැටියට ඉන්න රජ්ජුරුවෝ, ප්‍රධාන උනේ නැත්නම් මූලික උනේ නැත්නම් - රජ්ජුරුවන්ට අදහස ආවේ නැත්නම් - ඒ අවශ්‍ය කරන දේවල් සම්පාදනය කරේ නැත්නම් - අනිත් අය කොච්චර හිටියත් ඕක හැදෙන්නේ නෑ. ඒක නිසා යම්කිසි දෙයක් සිද්ධ වීම සඳහා හේතු වෙන්නාවූ -ඒකට මුල් වෙන්නාවූ ප්‍රධාන කාරණය - අනිත් සම්භාරයක තිබෙන ප්‍රධාන කාරණය කියන එක තමයි ඔය උපනිශ්‍රය කියල කියන්නේ. තවත් අපේ එදිනෙදා තියෙන්නාවූ dish එකක් ගත්තොත් එහෙම මට මෙහෙම හිතෙනවා. ඒක උපනිශ්‍රය කියන එකට දැන් අපි පරිප්පු හදනවනේ. දැන් අපි පරිප්පු හදල කෑවොත් මොනවත් එක්කද? ... කෑවේ පරිප්පුත් එක්ක කියනවා. ඉතින් එතකොට පරිප්පු විතරක්ම දාගෙන කැවද - පරිප්පු විතරක්ම තම්බල කැවද -පරිප්පු විතරක්ම heat කරලා ගත්තද - එතකොට තියෙනව ඒකට දාපු වතුර කිරි එතකොට ලූණු තුනපහ මිරිස් අරවමේවා ගොඩක් තියෙනවා. හැබැයි ඒවා ගැන ප්‍රධානත්වයක් තියෙනවා මේකේ. ආන්න ඒ වගේ යම්කිසි දේක ප්‍රධානත්වය නියෝජනය වෙන්නාවූ - අනිත් රංචුවකට ප්‍රධාන වෙන - නැතුවම බැරි කියන කාරණය තමයි උපනිශ්‍රය ප්‍රත්‍යය කියල කියන්නේ.

බොහොම පින් ස්වාමීන්වහන්ස පැහැදිලියි තෙරුවන් සරණයි!

**ස්වාමීන්වහන්සේගේ** - මට ප්‍රශ්නයක් තියෙනවා. මේ කියපු දේවල් අපේ පින්වතුන්ට ග්‍රහණය වෙනවද නැත්නම් නිකම්ම මේ පින්වතුන් ඉන්නවද කියල. එහෙම හැඟෙනවා. ඒකට මට ඔය පැත්තෙන් උත්තරයක් ලැබුනොත් එකත් පින්සිද්ධ වෙනවා.

අවසරයි ස්වාමීන්වහන්ස තේරුම් ගන්න ටිකක් අමාරුයි. ඒඋනාට මට හිතුන දැන් ස්වාමීන්වහන්ස මේක අහගෙන ඉදල යම්කිසි දවසක දෙයක් ගන්න පුළුවන් වෙයි කියල. ඔක්කොම ඔළුවට යන්නේ නැහැ හැබැයි පොඩි ප්‍රමාණයක් යනවා. ඔබවහන්සේගේ දේශනා සියල්ලම ඇහුවට පස්සේ යම්කිසි මූලික අදහසක් එයි කියල හිතෙනවා.

ස්වාමීන්වහන්සේ - ඒක හරි හොඳයිනෙ එහෙම කියපු එක. කොච්චර වටිනවද. හරි වටිනවා ඒක. ඒකට පොඩි වෙදකමක් අපි යොදාගනිමු. ඒක ඇත්ත එහෙම තමයි. දැන් හොඳට අහන්න ඕන. අනිත් එක තමයි අපි හැම එක්කෙනාගෙම දැනුමත් ඉතින් එක එක ආකාරයිනේ එක හින්ද - හැබැයි පොඩි වශයෙන් ඔය විදියට කරගෙන යනකොට යම්කිසි තැනකදී ඕක වැටහෙනවා. මේක හරිම අලුත්. සමහර පින්වත් පිරිසකට හරිම අලුත් මේක. ඒක නිසා සමහරවෙලාවට ඉතින් 'මේ මොකක්ද මේ' කියල හැඟෙන්න පුළුවන්. හැබැයි ඔය විදියට අදහස් ප්‍රකාශ කරනවානම් ඕක කියාගෙන යනකොට මම හැම වෙලේම

ශ්‍රාවකයා ගාවට බහිනවා. දැන් මම හිතාගෙන හිටියොත් එහෙම මේ කියන තාලේ ඔක්කොම ටික තේරෙනවා ඒක නිසා තව එකක් ඉක්මනට skip කරලා යන්න ඕනේ කියලා එහෙම හිතුවොත් එහෙම මේ පින්වතුන්ට අමාරුයි. ඔය විදියට කිව්වොත් එහෙම මට පුළුවන් තව මේකේ කාණ්ඩ පොඩියට පොඩියට කුඩු කරන්ට පොඩි කරන්ට කෑලි කරනට පුළුවන්. මම අද කියල දුන්න අව්‍යාකෘත ධර්ම කියල ඒක තේරුනාද? තේරෙන්න ඇතියි කියල හිතනවා.

තේරෙනවා ස්වාමීන්වහන්ස ඒ ටික තේරුණා ස්වාමීන්වහන්ස දැන් අර තික මාතිකා එහෙම කරනකොට කියපුව දැන් තවත් හොඳට තේරුනා මේ වෙලාවේ අහගෙන ඉන්න කොට. තව ටිකක් හිතට ආව. අනිත් එක ස්වාමීන්වහස අවුරුදු තුනම කියපු ඒවා අහගෙන ඉඳපු නිසා සෑහෙන දුරකට තේරෙනවා. තෙරුවන් සරණයි!

ගරු ස්වාමීන්වහන්ස මටත් ඔක්කොම තේරෙන්නේ නැහැ. නමුත් මම මේක වරින් වර අහනවා. මම record කරගන්නවා. record කරගෙන වරින් වර දෙතුන් පාරක් අහනකොට මම ලියාගන්නවා. මට 75% විතර තේරෙනවා. ජයන්ත මහත්තයල කට්ටිය මේක ආයිත් discuss කරනවා. එතකොට 100% නැති උනත් බොහෝ ප්‍රමාණයක් අපේ හිතට යනවා. එහෙම ටික ටික තමයි ඕක යන්නේ. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - බොහොම හොඳයි මහත්තයා එහෙම තමයි.

අවසරයි ස්වාමීන්වහන්ස අපිටනම් ඉතා හොඳින් වැටහෙනවා හාමුදුරුවනේ මොකක් හරි හේතුවක් නිසා. ඉතින් බොහොම ප්‍රීතියෙන් උද්දාමයෙන් කැමැත්තෙන් නිරන්තරයෙන්ම අහනවා සවන්දෙනවා ඉගෙන ගන්නවා හාමුදුරුවනේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - බොහොම හොඳයි මහත්තය ඒවගේ අපේ මහත්තයලට යන්තම් හරි පොඩ්ඩක් තේරෙන අය - අනිත් අපේ කල්‍යාණමිත්‍ර පින්වතුන්ට ධර්මය හොයන්නා වූ අයට එහෙම පිහිට වෙන එක හරි හොඳයි. මම දන්නවා දැන් මේ මණ්ඩලයේත් ඉන්නව හොඳට ධර්ම කරුණු කියල දෙන්න පුළුවන් හැකියාවක් තියෙන අය. එහෙම කරගෙන යන අයත් ඉන්නවා. ඒවගේ අනිත් අයට පිහිට වෙන්ට ඒකත් හරී වටින දෙයක් තමන්ට ධර්මය තේරුම් ගන්ට. රේරුකාණේ චන්දවිමල හාමුදුරුවෝ කියල තියෙනවා ඒ ස්වාමීන්වහන්සේ පොත් ලියන්න ගියාට පස්සෙලු හොඳට සමහර කරුණු හොඳට තේරුනා කියල කියන්නේ. ඒ කියන්නේ ලියන්න ලියන්න - සමහර ඒවා ඒ ස්වාමීන්වහන්සේ කියල දෙන්ට - කියල දෙන්ට හොඳට වැටහීමක් ආව කියල පොත් වල සඳහන් වෙලා තියෙනවා.

<u>අදහසක්</u> - ස්වාමීන් වහන්ස දේශනා කළානේ අර ඔබ වහන්සේට පුංචි කාලේ අර ස්වාමීන්වහන්සේ කෙනෙක් දැක්කහම පිණ්ඩපාතේ වඩින - සිතක් ඉපදුනා කියල මහණ වෙන්න. එතකොට ඔබ වහන්සේට ලෝභ කමක් අතිඋනා වගේ කියල මට හිතුන. එතකොට ඔබ වහන්සේට ......(පැහැදිලි මදි.) සිතද ඇති උනේ කියල මට හිතුනා

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒ අවස්ථාවේදී මට ලෝභ හිතක් ඇතිඋනේ නැහැ කියල මට sure. හේතුව ලෝභ සිත කියල කියන්නේ අකුසලයක්. අකුසල් සිතේ වැඩ කරන්නේ බොහොම අඩු ප්‍රමාණයක 18 – 19 – 21 වගේ ප්‍රමාණයක චෛතසික ධර්ම ප්‍රමාණයක්. ඕක අහන්ට

හේතුව මම දන්නවා. ඒ තමයි සමහර තැන් වලදී ධර්ම විස්තර කරනවා ප්‍රසාදයට ලෝභය කියල සමහර තැන්වල හඳුන්වනවා. මට ඇති උනේ ඇත්තටම හරිම පින්බර සැදැහැ සිතක්. ඕක මට විතරක් නෙමෙයි අනිත් අයටත් ඇතිවෙනවා. ඒක හරි ප්‍රසාද සිතක් - පහන් සිතක් - ඒ පහන් සිත කියන එක ප්‍රසාදනීය සිත කියන එක කුසල සිතක්. ඒ කුසල සිත ඇතිවෙන්න පුළුවන් බෝධීන්වහන්සේ නමක් ළඟට ගියහම - ස්වාමීන්වහන්සේ නමක් ළඟට ගියහම - දැන් ඕක මෙහෙම හිතන්න බැරිද? මට්ටකුණ්ඩලී එළියට දාල ඉන්නකොට බුදුරජාණන්වහන්සේ පෙනී හිටිනවා. එතකොට මට්ටකුණ්ඩලී හැරිලා බලනවා. බලනකොට එයාට ලෝභ සිතක්ද ඇතිඋනේ ප්‍රසාද සිතක්ද? ඇති උනේ ප්‍රසාද සිතක්. ඒ ප්‍රසාද සිත නිසා තමයි එයාට දිව්‍යයලෝකේ උප්පත්තිය ලබන්න හේතු උපනිශ්‍රය උනේ. මට ඇතිඋනේ දිව්‍යලෝකේ උප්පත්තිය ලබන්න හේතුවෙන එකත් තිබුනා නමුත් මහණ වෙන්න පුළුවන් - එතනින් අයින් වෙලා මහණ ජීවිතිය හොඳයි කියන තීරණයට එන්න හේතුවෙච්ච කුසල සිතක්. දැන් ඒක අකුසලය උනානම් මම මහණ වෙන්නේ නැනේ. ඒක නිසා ඕකේ සියුම් ගති තියෙනවා. අකුසලය - ලෝභ සිත වෙනයි. ඒවගේම ශ්‍රද්ධාවෙන් පිරිච්ච ප්‍රසාදනීය සිත - කුසල් සිත - වෙනයි. සමහර කෙනෙකුට මේක තේරුම් ගන්ට ටිකක් අමාරුයි. මම දවසක් එක තැනකට අරගෙන ගියා - ලංකාවේ තියෙනවා ලෙඩ්ඩුන්ට දෙන Glucose. මම ඒ Glucose අරගෙන ගියා කෙනෙක් අසනීප වෙලා හිටියා. ඉතින් මම Glucose අරන් ගියාට පස්සේ සුදුයි -සීනි පිටි වගේනේ. ඊට පස්සේ කිව්වේ මොකක්ද සුදු සීනි පිටි කරලා ගෙනල්ලයි කියල. ඔන්න වෙච්ච දේ. සීනිවලත් තියෙනවා තමයි නමුත් ඔය ගන්න ක්‍රමේ වෙනස්නේ. දැන් Glucose කියල සීනි විකුනන්නේ නැනේ. සීනි කියන එක වෙන නමකින්නේ විකුනන්නේ. Glucose කියන එකේ සීනි රහ තිබුනට ඒක වෙන විදියකටනේ ගන්නවා කියන්නේ. අන්න එහෙම සමහර වෙලාවට තියෙනවා පොඩි වෙනසක් තියෙනවා වෙනස හඳුනා ගන්න අමාරුයි. හොඳයි තෙරුවන් සරණයි!

බොහොම පින් ස්වාමීන්වහන්ස.

ජයන්ත මහතා - එහෙමයි ස්වාමීන්වහන්ස අපි හැමෝම වගේ ඉතාමත්ම ප්‍රයෝජනයක් ගන්නවා ස්වාමීන්වහන්ස මේ දේශනා වලින්. විශේෂයෙන්ම මේ වගේ කරුණු අපිට බහුලව දේශනාවල අහන්ටවත් පටිගත කරපු දේශනාවල අහන්ටවත් හරිම අඩුයි. ඒකනිසා අපිට ඉතාමත්ම භාග්‍යක් මේ වගේ අනුග්‍රහය ඔබවහන්සේ අපිට දක්වල මේ ධර්ම කරුණු ගලපලා දෙන එක ගැන. පොතකින් බැලුව උනත් ඇතම් අවස්ථාවලදී මතු කරගන්න තව හිතන්න වෙනවා. ඉතින් ඔබවහන්සේගේ මේ දේශනා ශෛලියත් එක්ක උදාහරණත් සහිතව අපිට මෙවැනි කරුණු දක්වන කොට අපිට ඒවා තේරුම් කරගන්න හැකියාව ලැබෙනවා ස්වාමීන්වහන්ස. අනන්ත අප්‍රමාණ පින් මේ කරන සේවයට ස්වාමීන්වහන්ස. ඉතින් එහෙමනම් අද දවසේ වැඩසටහන මෙතකින් නිමාවට පත්කරමු. ස්වාමීන්වහන්සේගේ වෙලාව රාත්‍රී 11. 45 ත් වෙලා. ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේට නැවත වරක් පුණ්‍යානුමෝදනා කරනවා ඒවාගේම අපි අත්කරගත් සියලු කුසල ශක්තීන් ඔබවහසේට නිදුක් නිරෝගී සුව ලැබේවා ඒවගේම ප්‍රාර්ථනා කරන බෝධියකින් නිවන් සුව අත් වේවා කියල ප්‍රාර්ථනා කරනවා - නිර්වාණ ධාතුව අවබෝධ වේවා කියල පූර්ණ

වශයෙන්. ස්වාමීන්වහන්ස අද දවසේ වැඩ සටහන නිමා කිරීම සඳහා නැවත වරක් යොමුවෙනවා ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

ස්වාමීන්වහන්සේ - හොඳයි පින්වත්නි සැමදෙනාටම සැනසිල්ලක් වේවා! ඉතින් අද මේ වෙසක් කාලේ මේ පින්වතුන් එකතුවෙලා හිත යොදාගෙන යොමාගෙන ශ්‍රද්ධාවෙන් පිරිච්ච හිතකින් මේ ධර්මය අහන්ට කන් යොමා ගත්තු එක කොච්චර වටිනවද. අපිට මේ වගේ නිරෝගිමත් කනක් ලැබිච්ච නිසා තමයි දැන් මේ බණ අහන්ට - කනට ගන්ට - හිතට ගන්ට - අවස්ථාව ලැබිල තියෙන්නේ. සංසාරේ අපිට මේ වගේ කනවල් කොච්චර ලැබෙන්ට ඇත්ද. ඒවගේම අපි මොන තරම් කුසල හෝ අකුසල මුල් කරගෙන භවාංග හිත් මුල්කරගෙන ජීවිත කාණ්ඩ ගෙවල ඇත්ද නමුත් මේ ජීවිතියේ මේ පින්වතුන් ලබාපු ඒ ප්‍රතිසන්ධි සිත - ඒකෙ තියෙන බලය - හයියක් හින්ද - ඒවාගේම ප්‍රතිසන්ධි සිතට අනුගාමීව අනුයතාව පවත්වාගෙන තියෙන්නාවූ මූල චිත්තය කියන්නාවූ මේ පින්වතුන්ගේ භවාංග සිත හොඳ බලවත් එකක්. ඒක නිසා තමයි ඒ භවාංග සිතක් හදන්ට ප්‍රතිසන්ධි සිතක් හදල මේ වගේ රූප කයක් මේ වගේ නිරෝගීමත් කනක් හදල දෙවන්ට පුළුවන් විදියේ මහා කුසලයක් පෙර කරල තියෙනවා. ඒකෙ විපාක ගොන්න ගස්සපු තැන මේ. ඉතින් ඒක නිසා මේ වෙසක් සමයේ මේ වගේ ගම්භීර ධර්ම අහල මනසිකාරය පවත්වල හිතල ධර්ම මනසිකාරයක් හදාගන්ට යෝනිසෝමනසිකාරයක් හදාගන්න ශ්‍රද්ධාව දියුණු කරගන්න හොඳ අවස්ථාවක් සැලසිලා තියෙනවා. මේ පින්වතුන් ඒකෙන් වැඩ ගන්නවා. අපි ඒ නිසා ගොඩක් සන්තෝස වෙනවා මේ පින්වත් සැමදෙනාටම ආශීර්වාද කරනවා තව තවත් මේ උතුම් ධර්ම මාර්ගයේ කුසල මාර්ගයේ නිදුක්ව නිරෝගීව යාගන්ට ලැබේවා කියල.

ඒවාගේම තමයි පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාට නිදුක් නිරෝගී දීර්ඝායුෂ සම්පත් අභිවර්ධනය වේවා! ඒවාගේම මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් ශාන්තියක් සැනසිල්ලක් යහපතක් වේවා! ඉතින් ඒ මහත්මයාගේ විශේෂ කැප වීම මත තමයි මේ කටයුතු බොහෝම සන්තෝසයෙන් සිදුකරන්නේ. ඒ වාගේම මේ ඕනැකම කම දන්න නිසාම තමයි අපි මේ කාලය වෙන්කරගෙන මේ පිහිට වෙන්නේ. අපිටත් පිනක් අහන්නාවූ අයටත් පිනක් කුසලයක්. ඒනිසා මේ කුසල් බලයෙන් තෙරුවන් සරණින් සැම දෙනාටම සුවසේ තව තව ධර්මය අහගෙන ගුණ වඩා ගන්න ලැබේවා! නොවැටහෙන තැන් හොඳින් වැටහේවා! ගැටළු සහගත තැන් නිරාකරණය වේවා! එක එක ධර්ම කරුණු හොඳට පටලැවිල්ලක් නැතුව තේරුම් අරගෙන වටහාගෙන ඒවාගේම බුදුරජාණන් වහන්සේ කෙරෙහි හොඳට ශ්‍රද්ධාව උපදින්නේ, ධර්මය අහන්ට අහන්ට - තේරෙන්ට - වැටහෙන්ට වැටහෙන්ට - පුදුම ශ්‍රද්ධාවක් බුදුරජාණන්වහන්සේගේ කෙරෙහි පහළ වෙනවා - ඇතිවෙනවා. ලෝකයේ හිස්බවත් ඒ විදියටම ඇතිවෙනවා. මේ ධර්මය අහගෙන මෙනෙහි කරගෙන තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව උපදවාගෙන මාර්ගය වඩාගෙන කෙළවර බුදුරජාණන්වහන්සේලා පසේබුදු මහරහතන් වහන්සේලා විසින් අව්‍යාකෘත වූ ධර්මයක් හැටියට ශාන්ත වූ ප්‍රනීත වූ ධර්මයක් හැටියට අවබෝධ කරගත්ත නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ වේවා! කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.